# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 05/2017

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2017 පෙබරවාරි මස 13 දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**ආයතන සඳහා කාර්ය මණ්ඩල පත් කිරීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් වන 1983 ජූනි 23 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 233 හි 2 (ii) ඡේදය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02.අධ්‍යයනාංශ ක්‍රියාත්මක වන ආයතනවල මහාචාර්ය හෝ පුස්තකාලයාධිපති තනතුරු හැර ආචාර්ය තනතුර සඳහා වන තේරීම් කමිටුවේ සංයුතිය සඳහා සාමාජිකයකු වශයෙන්, සලකනු ලබන අධ්‍යයනාංශයේ ප්‍රධානියා ඇතුළත් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කරන ලදී.

03. ඒ අනුව, මහාචාර්ය හෝ පුස්තකාලයාධිපති තනතුරු හැර ආචාර්ය තනතුරකට පත් කිරීම හෝ උසස් කිරීම සඳහා වන තේරීම් කමිටුවේ සංයුතිය පහත පරිදි විය යුතුය:

අ) සභාපතිවරයා වන ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා

ආ) කොමිෂන් සභාව මගින් පත් කරන ලද ශ්‍රී ලංකාවේ ඕනෑම විශ්වවිද්‍යාලයක අදාළ පීඨයක පීඨාධිපති

ඇ) සලකනු ලබන අධ්‍යයනාංශයේ ප්‍රධානියා ( <u>අධ්‍යයනාංශ ක්‍රියාත්මක වන ආයතන සඳහා පමණි</u>)

> සලකනු ලබන අධ්‍යයනාංශයේ ප්‍රධානියා ම අදාළ තනතුර සඳහා අයදුම්කරුවකු වන විට හෝ සලකනු ලබන අධ්‍යයනාංශයේ ස්ථිර ප්‍රධානියකු නොමැති නම්, අවස්ථාව පරිදි අධ්‍යයන මණ්ඩලය හෝ ඒ හා සමාන අධිකාරියක් සිය සමාජිකයන් අතුරින්, සලකනු ලබන අධ්‍යයන විෂයෙහි දැනුමක් සහිත සාමාජිකයෙකු, එවැනි අධ්‍යයනාංශ ප්‍රධානියෙකු වෙනුවට පත් කළ යුතු වන්නේය.

ඈ) කළමනාකරණ මණ්ඩලය විසින් සිය සාමාජිකයන් අතුරින් නාම යෝජනා කරන ලද, අවම වශයෙන් දෙදෙනෙකු කොමිෂන් සභාව මගින් පත් කරන ලද පුද්ගලයන් වන සාමාජිකයන් හතර දෙනෙක්

04. මෙම චක්‍රලේඛයෙහි විධිවිධාන 2017.02.15 දින සිට ක්‍රියාත්මක වනු ඇති අතර 1983 ජූනි 23 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 233 හි 2 (ii) ඡේදය මෙම චක්‍රලේඛය ක්‍රියාවට නැංවීමත් සමඟ අවලංගු වනු ඇත.

05.කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

**අත්. කළේ / මහාචාර්ය මොහාන් ද සිල්වා**

**සභාපති**

පිටපත්:

1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන්/ සහකාර ලේඛකාධිකාරිවරුන්
12. ආයතන/මණ්ඩපවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන්/ සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන් / සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

යූජීසි /එච්ආර්/ 2/3/85

ටී/-